**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**
**කොළඹ**

<u>පුවත්පත් නිවේදනය</u>

<u>"වාසුධායිව කුටුම්බකම්" සඳහා යෝගා කොළඹ නිදහස් චතුරස්‍රයේ දී</u>

ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය හා ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ සංස්කෘතික අංශය වන ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය විසින් විවිධ යෝගා මධ්‍යස්ථාන රැසක් සමඟ එක්ව 9 වන ජාත්‍යන්තර යෝගා දිනය නිමිත්තෙන් සංවිධානය කරන ලද යෝගා වැඩසටහනක් 2023 ජූනි 17 වන දින උදෑසන කොළඹ, නිදහස් චතුරස්‍රයේ දී පැවැත්විණ.

2. අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත මහතා, ප්‍රවාහන සහ මහා මාර්ග සහ ජන මාධ්‍ය අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා, විදේශ කටයුතු අමාත්‍ය අලි සබ්‍රි මහතා, දේශීය වෛද්‍ය අමාත්‍ය සිසිර ජයකොඩි මහතා, අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය ඒ. අරවින්ද් කුමාර් මහතා, උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය ආචාර්ය සුරේන් රාඝවන් මහතා යන විශේෂ අමුත්තන් ඇතුළු දහසකට ආසන්න පිරිසක් මෙම වැඩසටහන සඳහා සහභාගී වූහ. ඉන්දීය මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මහතා, මහ කොමසාරිස් කාර්යාලයේ නිලධාරීන් සහ කාර්ය මණ්ඩලය, ශිෂ්‍ය ශිෂ්‍යාවන්, පොලිස් නිලධාරීන්, ඉන්දීය ප්‍රජාවේ සාමාජිකයන් සහ ශ්‍රී ලංකාවේ යෝගා ලෝලීන් ද මේ සඳහා සහභාගී වූහ. ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් සංවිධානය කරන ලද මෙම වැඩසටහන හා ආයුර්වේද වෛද්‍යවරු සිය ගණනක් ද එක් වූහ.

3. රත්මලාන පරම ධම්ම චේතිය පිරිවෙනෙහි පරිවේණාධිපති අති පූජ්‍ය මා ඉටිපේ විමලසාර හිමියන් ආගමික වතාවත් වලින් පසුව මනුෂ්‍ය වර්ගයාගේ සමස්ත සුබසෙත උදෙසා ආශිර්වාද කළ අතර ඉන් අනතුරුව වැඩසටහන ආරම්භ විය. අශ්ටාංක යෝගා මන්දීර්, අෂ්ටාංග යෝගා ලංකා, ඕම් ක්‍රියා බාබාජි යෝගා ආරණ්‍යම්, බ්‍රහ්ම කුමාරි රාජ යෝගා මධ්‍යස්ථානය, හත යෝගා මධ්‍යස්ථානය, ඉන්සිටිටියුට් ඔෆ් හියුමන් එක්සලන්ස්, රිත්මික් යෝගා ඇකඩමි, ද ආර්ට් ඔෆ් ලිවින්ග්, යෝගා ෆො ඩිවයින් ලයිෆ්, රාම ක්‍රිෂ්ණා මිෂන්, සෙත්සඳ යෝගා නිකේතනය, කොළඹ විශ්ව විද්‍යාලය, කැළණිය විශ්ව විද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය සහ ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය වැනි ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ යෝගා ආයතනවල ප්‍රවීණයන් විසින් පැමිණ සිටි පිරිස සඳහා පවත්වන ලද මිනිත්තු 20ක යෝගා සහ භාවනා සැසිය මෙම වැඩසටහනේ විශේෂ ම අංගය විය. ඉන් අනතුරුව මයුරපති ශ්‍රී භද්‍රකාලි කෝවිලේ දරුවන් පිරිසක් විසින් උසස් යෝගා ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදී.

4. 2023 ජාත්‍යන්තර යෝගා දිනය දක්වා වන කාලය තුළ ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය විසින් විවිධ රාජ්‍ය ආයතන, යෝගා සංවිධාන සහ දේශිය සහකරුවන් සමඟ එක්ව දිවයින පුරා විවිධ වයස් කාණ්ඩ සහ වෘත්තීන් සඳහා යෝගා වැඩසටහන්, වැඩමුළු, දේශන සහ ඉදිරිපත් කිරීම් 90කට අධික සංඛ්‍යාවක් සංවිධානය කරන ලදී. මෙම වැඩසටහන් ශ්‍රී ලංකාවේ ජනතාවගේ සමස්ත සුබසිද්ධිය උදෙසා දෙරට අතර බෙදා හදා ගන්නා උරුමයක් වන යෝගා ව්‍යායාමවල වැදගත්කම ඉස්මතු කිරීමට ගන්නා ලද ප්‍රයත්නයකි.

5. කොළඹ නිදහස් චතුරස්‍රයේ පැවති ජාත්‍යන්තර යෝගා දින සැමරුම "ආක්ටික් සිට ඇන්ටාක්ටික්" දක්වා රටවල් යෝගා ව්‍යායාම හරහා එකට එක් කිරීමට 2023 ජාත්‍යන්තර යෝගා දිනයේ ගන්නා විශේෂ පියවරේ කොටසක් වේ. ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය 2023 ජූනි 21 වන දින කොළඹ වරායේ දී තවත් යෝගා වැඩසටහනක් සංවිධානය කරනු ඇති අතර ඒ අනුව 2023 ජාත්‍යන්තර යෝගා දිනය නිමිත්තෙන් සිදු කරන සුවිශේෂී කර්තව්‍යයක් වන "ගෝලීය සාගර වළල්ල" හා එක් වනු ඇත. මෙම වසරේ ජාත්‍යන්තර යෝගා දින සැමරුම් ඉන්දියාවේ වර්තමාන G20 සභාපතිත්වයේ තේමාව වන වාසුධායිව කුටුම්බකම් එනම් "එක් පෘථිවියක්, එක් පවුලක්, එක් අනාගතයක්" යන තේමාව හා සමපාත වේ.

6. 2014 වසරේදී ඉන්දියාවේ මූලිකත්වයෙන් ගෙන එන ලද යෝජනාවක් සම්මත කරමින් එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය සෑම වසරකම ජූනි 21 වන දින "ජාත්‍යන්තර යෝගා දිනය" ලෙස නම් කරන ලදී. මෙම යෝජනාව සඳහා රටවල් 170ක් සහය ලබා දුන් අතර ශ්‍රී ලංකාව එහි සම අනුග්‍රාහකයකු විය.

***

කොළඹ
2023 ජූනි 19